# ස්ත්‍රී පුරුෂ භාවය දක්වන සංකේත වල මූලික පදනම කුමක්ද ?



දයාරත්න වීරසේකර

දැනට දශක කිහිපයකට ඉහත දී, අලුත උපන් දරුවෙකු සඳහා ජ්‍යෝතිෂකරුවකු ලවා ජන්ම පත්‍රයක් සකස් කිරීම පුරුද්දක් වශයෙන් කරන ලදි. මෙම ජන්ම පත්‍රය ඇසුරෙන් පසුව සකස් කරනු ලබන " හඳහන" ජන්මය පිලිබඳ වැදගත්ම සටහන විය. ඒ කාලයේ හඳහන පුස්කොල තීරුවක පන්හිඳෙන් ලියා, කලු මැද, සකස් කරගන් නා ලද සටහනක් විය. පුස් කොලයක් යනු විශේෂිත ශාස්ත්‍රීය ක්‍රම වේද වලට අනුව සකස් කරගන්නා ලද තල්පතකි. මෙහි සටහන් වන බොහෝ කරුණු කියවා තේරුම් ගත හැකි වනුයේ ජ්‍යෝතිෂය ගැන දන්නා අයෙකුට පමණකි. උපන් වේලාව, නැකත, මුහුර්තය, ගණ කිරීම වැනි විවිධ ක්ෂේත්‍ර වලට අයත් බොහෝ කරුණු හඳහනෙහි ඇතුලත් වේ.

දශක හතකට වඩා පැරණි මගේ හඳහන තවමත් ඒ ආකාරයෙන්ම පවතී. එය දෙතුන් වරකට වඩා ප්‍රයෝජනයට ගෙන නොමැති තරම්ය. මට මතක ඇති කාලය තුළදී නම් එහි ඇති කරුණු ගැන විමසිලිමත් වූයේ විවාහ වන අවස්ථාවේදී සහ නිවසක් සෑදීමට මුල් පුරන අවස්ථාවේදී පමණය. මාගේ හදහනේ ස්ත්‍රී පුරුෂ භාවය සඳහන් කර ඇත්තේ "පිරිමියා" යනුවෙනි. ස්ත්‍රී හඳහන් වල මෙය සඳහන් කරනුයේ "ගෑණී" යනුවෙන් බව දැක තිබේ. හඳහන් ලිවීමේ



පැරණි කලාව දැන් දැන් ක්‍රම ක්‍රමක්‍රමයෙන් තුරන් වෙමින් පවතින බව පෙනේ.

පැරණි ග්‍රීක් සටහන් වල දැක්වෙන පරිදි ස්ත්‍රී සහ පුරුෂ බව දැක්වීම සඳහා සංකේත භාවිත කළ බව දකින්නට ලැබේ. මේ සඳහා ග්‍රහ වස්තුවල සංකේත යොදා ගෙන තිබේ.

මෙයින්, පුරුෂ බව හඟවන කුජ සංකේතයේ දැක්වනුයේ පලිහක් සහ හෙල්ලක සංයෝජනයකි. එසේම ස්ත්‍රී බවෙහි සංකේතය වන සිකුරු දැක්වෙන්නේ මිටක් සහිත මුහුණ බලන කන්නාඩියක් ලෙසින්ය. මේ ලොව පිළිගත් සංකේත බවට



පත්විය. ග්‍රීක ව්‍යවහාරයේ ආරම්භ වූ මෙම සංකේත කිසිවක් අපගේ පැරණි හඳහන් වලනම් දකින්නට නොලැබේ.

1751 වසරේදී ශාක අභිජනනය පිළිබඳ පර්යේෂණ කරන ලද ජීවින් නම්කිරිම සඳහා සකස් කර තිබෙන ද්විපද නාමකරණයේ නිර්මාතෘ ලෙස සැලකෙන, ස්විඩිෂ් ජාතික කාල්ලිනෙයස් විසින්, තම පර්යේෂණ සඳහා යොදා ගත් ශාක පුෂ්ප වෙන වෙනම හඳුනා ගැනීම සඳහා මෙම සංකේත භාවිතා කර ඇත. දැනුදු විද්‍යවේ සහ වෛද්‍ය විද්‍යාවේ, පුං (male) සහ ජයා (female) භාවය දැක්වීම පිණිස මෙම සංකේත බහුලව භාවිත වේ. ලිනේයස්ගේ පර්යේෂණවලට සම්බන්ධ කළ බොහෝ ශාක, ද්විලිංගික වූ නිසා ඔහුට තවත් සංකේතයක් අවශ්‍ය විය. මේ සඳහා මුල් සංකේත දෙකෙහිම සංයෝජනයක් සකස් කර ගැනීමට සිදුවිය. බුධ ග්‍රහයා සඳහා භාවිතා කළ සංකේතය මේ සඳහා බොහෝ දුරට අදාල කර ගත හැකි විය.



දශක කිහිපයක් යන තුරුම මෙම සංකේත භාවිත වූවද මෑතක සිට ජීවින්ගේ පෙළපත් සටහන් (Pedigre charts) සකස් කිරීමේදී පහසුව සඳහා මුල් සංකේතත් සමඟම වෙනත් ක්‍රමවේදයක් උපයෝගී කරගනු





ලැබේ. එම සංකේත සටහන් මෙසේය.



සම චතුරස්‍රය ජීවියෙකුගේ පුං භාවය පෙන්වන සංකේතය (සමහර අවස්ථාවලදී ත්‍රිකෝණයද භාවිත වේ.



සම චතුරස්‍රය ජීවියෙකුගේ පුං භාවය පෙන්වන සංකේතය (සමහර අවස්ථාවලදී ත්‍රිකෝණයද භාවිත වේ.

ඔබට නිතර දකින්නට ලැබෙන වෙළඳ දැන්වීමක තිබෙන පහත දැක්වෙන සං කේතය හඳුනා ගත හැකිද ?



සංකේතය වෙළඳ භාණ්ඩයක

මෙම සංකේතය වෙළඳ භාණ්ඩයක් ප්‍රචාරය සඳහා යොදා ගැනීමකි. එහි දැක්වෙනුයේ පුංභාවය පෙන්වන සංකේතයයි.

ග්‍රේගර් මෙන්ඩල් විසින්, 1854 දී, ශාක වල ගති ලක්ෂණ විදහා දැක්වීම සඳහා ඉංග්‍රීසි අක්ෂර යොදා ගැනිමේ ක්‍රම වේදයක් සොයාගැනීමත් සමඟ, ජනක විද්‍යාව නමින් ප්‍රවේණිය පිළිබඳ අධ්‍යයන ක්ෂේත්‍රයක් ආරම්භ විය. ජීවි පෙළපත් සටහන් සකස් කිරිමේදී මෙම අක්ෂර සංකේත බහුලව භාවිත වේ.

ලිනෙයස් විසින් භාවිත කරන ලද සංකේත, බෙහෙවින් ප්‍රයෝජනවත් වන ආකාරය පහසුවෙන් අවබෝධ කරගත හැකි සරල ක්‍රමයක් පහත දැක්වේ.

සෑම ජීවි සෛලයකම න්‍යෂ්ටියක් තිබෙන බව අපි දනිමු. න්‍යෂ්ටිය තුළ වර්ණ දේහ පිහිටන අතර, වර්ණදේහවල ජාන අන්තර්ගත වේ. පහත රූප සටහනේ දැක්වෙන්නේ ශාක සෛලයකි.



ශාක සෛලයක ව්‍යුහය

ඊළග රූපයේ දැක්වෙන්නේ වර්ණ දේහ යුගලයක ජාන කිහිපයක් පිහිටා ඇති ආකාරයයි.




වර්ණදේහ යුගලයක්

අප කලින් සඳහන් කළ පරිදි, ජීවින්ගේ ගැහැනු හෝ පිරිමි භාවය හට ගැනීම සඳහා න්‍යෂ්ටියේ ඇති සුවිශේෂි වර්ණ දේහ යුගලයක බලපෑම අවශ්‍ය වේ.

මිනිසා තුළ මෙම සංසිද්ධිය සිදුවන්නේ කෙසේදැයි සැකෙවින් විමසා බලුම. සෑම ජීවියෙකුගේම එක් එක් සෛලය තුළ න්‍යෂ්ටිය බැගින් තිබේ. මෙම න්‍යෂ්ටියේ යුගල වශයෙන් තිබෙන වර්ණදේහ සංඛ්‍යාව ඒ ඒ ජීවියාට සුවිශේෂි වේ. පලතුරු මැස්සා වැනි කුඩා ජීවියෙකුගේ වර්ණදේහ යුගල හතරකි. මිනිසාගේ ඉතිරි යුගල 23 කි. මෙම වර්ණ දේහ වලින් එක් යුගලයක් ලිංගිකතාව තීරණය කරයි. මිනිසාගේ ඉතිරි යුගල 22 හි ඇති ජාන මගින් අනිකුත් විවිධ ගති ලක්ෂණ හුවා දක්වනු ලබයි. වර්ණදේහ යුගලයෙන් එකක් මවගෙන් ලැබී අතර දෙවැන්න ලැබෙනුයේ පියාගෙනි. ඒකාකාර වර්ණදේහ යුගලයක එකම සෙව්වේ තිබෙන ජාන මගින් යම්කිසි සුවිශේෂි ගති ලක්ෂණයක් පෙන්නුම් කරයි. උදාහරණයක් වශයෙන් මිනිසාගේ හිස කෙස් රැලි සහිත භාවය සඳහා අවශ්‍ය ජානය එක් වර්ණදේහ යුගලයක අන්තර්ගත වේ. මෙවැනි ගති ලක්ෂණ දහස් ගණනක් මෙහෙයවනු ලබන ජාන වර්ණ දේහ වල විසිරි පවති. සාමාන්‍ය වර්ණදේහ වල අන්තර්ගත ජාන මගින් බොහෝ ගති ලක්ෂණ පිළිබිඹු කරන අතරම, ලිංගිකතා වර්ණදේහ වල පිහිටන ජාන මගින් පාරම්පරික ලෙඩ රෝග හටගැනීම, පිරිමින්ගේ තට්ටය පෑදීම, වර්ණ අන්ධභාවය වැනි ඉතා සුවිශේෂි ලක්ෂණ ඉස්මතු කරයි.

ඕනෑම ජීවි ග්‍රහණයක (මිනිස් හෝ වෙනත් ) පුං (Male) සහ ජායා (female) ජීවිහු







බොහෝ දුරට 1:1 අනුපාතයට අනුව දකින් නට ලැබේ. නැතහොත් පිරිමි සහ ගැහැණු ප්‍රතිශතය සියයට පනහ ප්‍රමාණයකට ආසන් නව පවති. මෙම සංසිද්ධිය සොබා දහමේ ප්‍රාතිහාර්යයක් ලෙස සැලකිය හැකිය.

මෙම අති සූක්ෂම ක්‍රියාවලිය පහසුවෙන් විග්‍රහ කිරීම පිණිසද අප කලින් සඳහන් කළ සංකේත භාවිත කළ හැකිය.

මිනිසා ඇතුළු අනිකුත් සතුන්ගේ සහ ශාකවල අලුතින් ජීවියෙක් හට ගැනීම සඳහා පුං ජන්මාණු (male gametes ) සහ ජායා ජන්මාණු (Female Gametes) සම්බන්ධ වී සංසේචනයක් සිදුවිය යුතුය. මෙය ලිංගික ප්‍රජනනයි.

මෙහිදී ක්‍රියාත්මක වන්නේ කලින් සඳහන් කරන ලද පරදි, ජීවින්ගේ ලිංගිකතාව විදහා දක්වන වර්ණදේහයි. මිනිසාගේ ප්‍රජනන ක්‍රියාවලිය සලකා බැලීමේදී කලින් සඳහන් කළ ආකාරයට මිනිස් ගහණයේ ස්ත්‍රී පුරුෂ සමානුපාතය බොහෝ දුරට 1:1 මට්ටටමන් රඳ පවතිනුයේ ස්ත්‍රියගේ සහ පුරුෂයාගේ ලිංගික වර්ණදේහවල තිබෙන එකිනෙකට වෙනස් වැදගත් ලක්ෂණයක් නිසාය.

ස්ත්‍රියකගේ ඒකාකාර ලිංගික වර්ණදේහ යුගලය ඩඩ ලෙස හඳුන්වන අතර පුරුශෙ යකුගේ එකිනෙකට වෙනස් ලිංගික වර්ණ දේහ යුගලය ඩශ ලෙස හැදින්වේ ස්ත්‍රිය කගේ ඩ වර්ණදේහය සහ පුරුෂයෙකුගේ ඩ වර්ණදේහය බොහෝ දුරට සමානය. එහෙත් පුරුෂයෙකුගේ ශ වර්ණදේහය ඩ වර්ණදේහ වලට වඩා හාත්පසින්ම වෙනස් වේ.



44 වන පිටට